ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2014 නොවැම්බර් 03 සඳුදා
07 වෙළුම - 02 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 36/ News/ 2014

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



# පුංචි ඔබ වෙනුවෙන් දැන් සිඟිති බයිබලය පිටවුනා

Lama Pradeepaya

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් lamapradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# නත්තලට පෙර මසක් ඇතුළත සිතන්නට යමක්

## ආදරණීය දුවේ පුතේ...

දැන් දැන් ඔබේ නිවසේ නත්තල් ගසක් නිර්මාණය කරන්නට ඔබ උනන්දු වන කාලය නේද? උඳුවප් සමය උදාවන විටම පුංචි ඔබ නත්තල් ගස ගැනත් කථා කරනවා. එය හොඳ දෙයක්. නත්තල් ගස කතෝලික අපගේ සංකේතයක්. අද එය විවිධ ලබ්ධිකයින් තේරුමක් නැතිව තමන්ගේ වානිජ ව්‍යාපාරවල සළකුණක් කර ගන්නට හදනවා. නත්තල් ගසේ කතාන්දරය වගේම ආගමන මල් කළඹ ගැනත් ඔබ අවබෝධයක් ඇතිව මේ සමය තුළ ජීවිත ගත කරන්නට ඕනා.

පුංචි ඔබ මේ නත්තල් සමය තුළදී නත්තල් ගසට, කුඩා ගවලෙනට දක්වන උනන්දුව තුළ එක්තරා අයුරකින් ඔබේ කතෝලික විශ්වාසය මුවහත් කරන්නටත් එය උපකාරි වනවා.

ඉතින් ඒ නිසා මෙවර අපි ආගමික මල් කළඹ පිළිබඳව දැනුම්වත් වෙන්නට උත්සහ කරමු. ආදර දුවේ පුතේ, ඔබ මේ දිනවල දේවස්ථානයට යන විට අල්තාරය අබියස සූදානම් කර තිබෙන ආගමික මල් කළඹ දකිනවා නේද? මෙය ඇත්තෙන්ම ආගමික සමය තුළ පසු කරන්නාවූ එක් එක් සතිය සලකුණු කරමින් ක්‍රම ක්‍රමයෙන් ක්‍රිස්තෝත්පත්ති මංගල්‍යය කරා අප අධ්‍යාත්මික ගමනක යෙදෙන බව අපට සිහිපත් කර දෙන ධර්මතාවයේ අභ්‍යාසයක් සේ හඳුන්වා දෙන්නට පුළුවන්.

මේ මල් කළඹේ අතීත කථාව විවිධ දිශානතින් වෙත යොමු වී ඇතත් අද අපි භාවිත කරන මේ ස්වරූපයේ මල් කළඹ නිර්මාණය කොට ඇත්තේ ජර්මානු ජාතික දේව ධර්මාචාර්යවරයකු වන ජොහැන් හින්රිච් විචර්න් බවට ඉතිහාසය දෙස් දෙනවා. එහි ආරම්භයත් පුංචි දරුවන්ට ඉතා උපකාරී වන පසුබිමකයි නිර්මාණය වී තිබෙන්නෙ. ජර්මනියේ හැම්බර්ග් නගරයේ දුප්පත් දරුවන් වෙනුවෙන් මේ දේවධර්ම ආචාර්යවරයා නිවසක් අරඹා තිබුනා. නත්තල උදාවන්නට සති කිහිපයකට කලින් සිටම නත්තල උදාවී නැත්තේ ඇයිදැයි අසමින් ඇවිටිලි කරන්නට මේ දරුවන් හැම වසරකම පටන් ගත්තා. ඉතින් නත්තලේ මිහිරියාව නැති කරන්නේ නැතිව දරුවන්ටත් සතුටක් ලබා දෙවන්නට ජොහැන් හින්රිච් පොඩි උපක්‍රමයක් යෙදුවා. ඔහු කරත්ත රෝදයක් යොදා ගෙන ලී රාමුවක් සාදා එහි ලොකු ඉටිපන්දම් සහ කුඩා ඉටි පන්දම් සවිකර ඉරුදිනයක ලොකු ඉටිපහනක් සහ සතියේ දිනවල කුඩා ඉටි පහනක් බැගින් දල්වා ඒ සියලු ඉටිපහන් දැල්වෙන අවසාන දිනයේ නත්තල උදා වන බව දරුවන්ට මතක් කර දුන්නා. 1839 වසරේ සිදු වූ ඒ අත්දැකීමත් සමගම අද එය විවිධ වෙනස් කම් වලට භාජනය වී ඉටි පහන් 5 ක් පමණක් දල්වන්නට සංකේතවත් වී තිබෙනවා.

ආදර දුවේ පුතේ, අද සැකසෙන මේ ආගමන මල් කළඹ ඉතා සරලව කුඩාවට නිර්මාණය වී ඇති අතර කවාකාර රාමුව තුළ ඉටිපහන් සතරක්ද , රාමුව මධ්‍යයේ එක් ඉටිපහනක් ලෙසද මෙය සවි කරනු ලබනවා. රාමුව කොළ පැහැයෙන් සරසනු ලබනවා. ඒවා දල්වන්නේ මෙසේයි. ඒ අනුව ආගමික සමයේ පළමු ඉරුදින දම් පැහැති ඉටිපහනද දෙවැනි ඉරුදින අනෙක් දම් පාට ඉටි පහනද තුන් වැනි ඉරුදින රෝස පැහැති ඉටිපහනද හතරවැනි ඉරුදින අවසාන දම් පාට ඉටිපහනද නත්තල් දින සුදු පැහැති ඉටිපහනද දල්වා ලනවා.

ක්‍රිස්තුස් වහන්සේ ලෝකයේ ආලෝකය ලෙස මෙලොව මංගගත වීම මේ ආලෝකයේ සංකේතයේ මූලික අදහසයි. මේ මල් කළඹ කවාකාර හැඩයක් ගනු ලබන්නේ එහි ආරම්භයක් හෝ අවසානයක් නොමැති බව මූර්තිමත් කරන්නටයි. ඒ අනුව දෙවියන් වහන්සේටත් ආරම්භයක් හෝ අවසානයක් නොමැති බව අප හැමට අවබෝධ කරලන අතරම ක්‍රිස්තුන් වහන්සේ ලෝකයේ ආලෝකය මෙන්ම එහි ආරම්භයත් අවසානයත් වන බවත් සිහිපත් කරනවා.

එලෙසම ආදර දුවේ පුතේ , ඉටිපහන් වල වර්ණයත්, කාලයත් හා දිනයත් සැලකීමේදී දම් පැහැ ඉටිපහන් තුන මනස්ථාපනය හා සිත් හැරීම සංකේතවත් කරනවා. තුන් වන සතියේ ඉරුදින දල්වාලන රෝස පැහැති ඉටිපහනෙන් සංකේතවත් වන්නේ ආනන්දය හෙවත් ප්‍රීතියයි. මෙම ඉටිපහන් එකිනෙක දැල්වෙන්නා සේ අපද කෙමෙන් ක්‍රිස්තෝත්පත්තිය සමරන්නට අප සිත් ආලෝකමත් කර ගනිමින් සූදානම් විය යුතු බව අපට සිහිපත් කරනවා. කවාකාර කළඹේ මැද දල්වන සුදු ඉටිපහන නත්තල් දවසේදී ආලෝකමත් වන්නේ ක්‍රිස්තුන් වහන්සේ හෙවත් ලෝකයේ ආලෝකය ලොවට උදාවී ඇති බව සිහිගන්වමිනුයි.

එලෙසම දුවේ පුතේ, පළමු ඉටිපහන දිවැස්ප්‍රසාදිවරුන්ගේ ඉටිපහනයි, (බලාපොරොත්තුව). දෙවැනි ඉටිපහන බෙත්ලෙහෙමේ ඉටිපහනයි, (බැහැපත් බව). තුන්වන ඉටිපහන එඬේරුන්ගේ ඉටිපහනයි, (ප්‍රීතිය). හතරවන ඉටිපහන දේව දූතයන්ගේ ඉටිපහනයි. (සාමය). දැන් ඔබට ආගමික මල් කළඹ ගැන හොඳ අවබෝධයක් ලැබෙන්න ඇති. තවත් මෙනෙහි කර කරුණු එකතු කර ගන්න.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# අපි ජේසු සමිඳුන් මෙන් සිතමු.



පායන හිරු මෙන්, මුළු ලොවටම එක හා සමානව එළිය බෙදූ චරිතයක් වූ නාසරතයේ ජේසු සමිඳුන් මෙන් සිතීමට අපට හැකිද? නිසැකවම අපට එය කළ හැකිය. නාසරතයේ ජේසු සමිඳුන් තම මුළු ජීවිත කාලය තුළම තම පියා වූ දෙවියන් වහන්සේ ගැන පූර්ණ විශ්වාසය තැබුවා මෙන්, අපි අපිවම දැඩි ලෙස විශ්වාස කළහොත් උන්වහන්සේ හා අනුගාමික වීම එතරම් අපහසු කාර්යයක් ලෙස මම සිතන්නේ නැත.

ප්‍රේමය, සමානාත්මභාවය, ගරුකිරීම වැනි ගුණධර්ම පදනම් කරගෙන තම යුතුකම් ඉටු කිරීම සඳහා මෙලොවට පහළ වූ උදාරතම , ආදර්ශවත් චරිතයක්වන ජේසු සමිඳුන්ගේ මූලික කටයුත්ත වූයේ යුක්තිය ඉටුකිරීමයි. යුක්තිය ශක්තිය කරගත් එතුමාණෝ තම යුතුකම්ද ඉටු කරමින් මානව සමාජයටම ආදර්ශයක් වූයේය. කානා නුවර වතුර වයින් කිරීමේ සිද්ධිය තුළින් පුතකු ලෙස තම ආදරණීය අම්මාට ඇති ගෞරවයත් නොනිවෙන ප්‍රේමයත් හා පරිත්‍යාග ශීලීත්වය තුළ තම මෑණියන්ගේ අභිප්‍රාය ඉටු කරන්නේ දරුවකුට මවකගේ ආශිර්වාද ය අවවාද තරම් දෙයක් මිහිපිට නොමැත්තේය යන කරුණ සනාථ කරමින් තවද මත පියාට ගරු කරමින් එතුමාගේ මඟ පෙන්වීම තුළ පාළුකරයේ දින 40 නිරාහාරව සිටිමින් ගොඩනගා ගත් ස්ප්‍රීන්තුවෙන් සාතන් පරාජය කළේ පරිත්‍යාගය තුළිනි.

නැති බැරි කම් වලින් පීඩිත වූ, ලෙඩ රෝග වලින් අඩපණ වූ මිනිස් සමාජය දෙස ප්‍රේමය පිරුණු දෑසින් හා අනුකම්පාව පිරුණු හදවතකින් නාසරතයේ ජේසු සමිඳුන් ක්‍රියාකරන්නේ යුක්තිය ඉටු කරන්නට නොවේද? අද සමාජය දෙස බැලූ කළ ''යුක්තිය'' යන වචනය විකා අවසන් කළ චුයිගම් හපයක් ගානට වැටී තිබේ. වත්මන් ආර්ථික , සමාජීය, දේශපාලනය දෙස හැරී බැලූ කළ ඉන් එකකවත් ''යුක්තිය'' යන වදන පෙනෙන්නට නැති බව මම පමණක් නොව ඔබද දන්නා කරුණකි. වර්තමාන ධනේෂ්වර ආර්ථික පසුබිමක් සහිත සමාජය තුළ සාමාන්‍ය මෙන්ම දිළිඳු ජනයාටද මුහුණදීමට සිදු වී ඇත්තේ ඉතාම දුක්ඛිත ඛේදවාචකයකටය.

ජේසු සමිඳුන් අනුගාමිකව ''පරිත්‍යාගය'' නම් වූ උතුම් ක්‍රියාවලිය තුළ තම ජීවිත ජයගත් බොහෝ පිරිස අප අතර වෙති. ඔවුන්ගේ ජීවන වෘතාන්ත තුළ අපට දැකිය හැකිකේ ඔවුන් තුළ වූ අපරිමිත, විශ්වාසය හා කැපවීමය. උසස් බුද්ධියකට හිමිකම් කියන ''මිනිසුන්'' ලෙස අපද උත්සහා කළ යුත්තේ අපි ජීවත්වන සමාජයට ආදර්ශයක් වන ලෙස කටයුතු කිරීමටය.

**සමාජය සුව කරන ඔසුවක් වෙමු.**

පාසල් දරුවන් ලෙසත්, යෞවන, යෞවනියන් ලෙසත් වත්මන් ලාංකීය සමාජය තුළ අප සැම අතිශය භාර දූර කාර්ය භාර්යකට සමිඳාණන් කැඳවා ඇත. දෑස් නිලංකාර කරන මනස අප්‍රාණික කරන රූපවාහිනී නාලිකා තුළ ඇති බොළඳ අරුත් සුන් නාට්‍ය, ගීත, සංගීත හා ''රියැලිටි'' නම්වූ හිස් වැඩසටහන් අප තුළ වල්මත් බව ඇති කර ඇත තමන්ගේ ජීවිතයේ ''රියැලිටි'' භාවය නොදන්නා අයියලා අක්කලා රූපවාහිනී තිරයේ දිස්වෙන කොල්ලන්ට කෙල්ලන්ට SMS කර ඔවුන්ව රියැලිටියට අත දෙමින් තමාගේ රියැලිටිය දුප්පත් කරනවා නොවේද? ඒවා පිළිබඳව හොඳින් දැනුවත්ව ඊට වඩා ගැඹුරු අර්ථවත්, ජීවිතයක් ගොඩ නගා සිටු විය හැකි අධ්‍යාපනය ආර්ථිකය ගොඩනගා සිටුවිය හැකි කටයුතු වලට යොමු විය යුතු කාලය උදා වී ඇත. ඒ සඳහා පොත පත කවි යනාදිය කියවීමෙන්ද ලේඛනයේ යෙදෙමින්ද, යාච්ඤා , සම්මන්ත්‍රණ වලට සහභාගී වෙමින්ද වර්තමානය ජයගතයුතුව ඇත.

එදිනෙදා අප වෙත පැවරෙන වගකීම ඉටු කිරීමට අපට හැකි වී තිබේද? එය හරියාකාරව ඉටුකිරීමට අවවාද උපදෙස් යන විටමින්ද වැරදි නිවැරදි කර ගැනීම තේරුම් ගැනීම නම් වූ ඛණිජ ලවණ ද නොඅඩුව දිනපතා ධාරණය ගත යුතුය. බහු වාර්ගික සාමාජයක සාමාජික සාමාජිකයන් වන අප, රට තුළ ගෙවී ගිය කාල පරාසයන් තුළ අපගේ වැඩිහිටියන් විසින් ගනු ලැබූවැරදි තීන්දු තීරණ නිසා සමස්ත ජාතියම කෙතරම් දුකට පත් වුණිද? එබැවින් නාසරතයේ ජේසු සමිඳුන් මෙන් සිතන්නට හා ක්‍රියාකාරී වීමට හැකිනම් දුකට පත් අපරටට යළි සතුට සැනසුම ගෙන ඒමට අපට හැකි වනු ඇත. එම නිසා සමාජය තුළ ඇති ක්‍රෝධය ඊර්ෂ්‍යාව, මෝහය, තන්හාව වැනි යක්ෂ පරික්ෂාවලට තිත තබා පරිත්‍යාග යේ, ප්‍රේමයේ, කරුණාවන්ත, බවේ හා සත්‍ය හඳුනාගැනීමේ මඟ අප ගමන් කළ යුතුය. ඒ උතුම් කාර්‍යය සඳහා පාසලේදී , ගමේදී, පාසල් වෑන් රථයේදී, පාරේදී, පල්ලියේදී, පන්සලේදී අපි අපට අවංකව කටයුතු කළ යුතුය.

කුමන ආගමක්, ජාතියක්, වුවත් අප තුළ පරිත්‍යාගය නම් වූ පිරිසිදු චේතනාව ඇති නම් මුළු ලෝක සත්ත්වයාටම දුකෙන් මිදී තමා පිළිබඳ නිවැරිදි වටහා ගැනීමක් ඇති කරගත හැකිය. මේ ලොව අද වන තුරු මෙසේ හෝ පවතින්නේ අප නාසරතයේ ජේසු සමිඳුන් ඇතුළු උතුම් මනුෂ්‍යයන්ගේ පරිත්‍යාගයන් හේතු කොට ගෙනය. ඉතින් ළමුන් ලෙස අපගේ කැඳවීමට යහපත් ප්‍රතිචාර දැක්විය යුතුය. එයයි ජේසු සමිඳුන් අපට කරන ඇරයුමේ අර්ථය වන්නේ.

**නිපුනි මිෂෙල් හෙට්ටිආරච්චි**
12 ශ්‍රේණිය
යහපත් එඬේරාගේ කන්‍යාරාමය - කොළඹ 13

# පළඟතුරය ශා. ආනා දහම් පාසලේ දක්ෂ ලේඛකයෝ

## දයාවේ මව්තුමී



කිරිකැටි සිහින පොදිබැදගෙන මේ ලෝකේ
අහිමිව ආලයක් ලබනට මෙලොව තුළින්
දහසක් දිවි අතරින් තනිවු විටදී
ඔබය මවේ සරණය නිති ලැබදුන්නේ

මහළු දනන්ටද නිති රැකවරණය දුන්නේ
අසරණ වුවන් හට නවාතැන් වුයේ
පොඩි පොඩි දරුවන් හට සිනහව දුන්නේ
ඔබයි තෙරේසා මව් තුමියනි

**මනේෂා නවෝදි**
10 ශ්‍රේණිය
**සා. ආනා දහම් පාසල - පළඟතුරය**



**ටිෂාන් හර්ෂන**
11 ශ්‍රේණිය
**සා. ආනා දහම් පාසල - පළඟතුරය**

## වැඩමුළුවක ප්‍රතිඵලයක්

## සුන්දර උදෑසන



කඳු මුදුනින් පායන්නේ
කුරුළු ගීත ඇසෙන්නේ
සීත සුළං හමන්නේ
උදෑසනයි මේ එන්නේ

රන් කිරණක් සේ බබළයි
මිනි කැට මුතු වාගේ පෙනෙයි
අවදිවන්න යාළුවනේ
මේ සුන්දර උදෑසනේ

**කෞෂානි වන්නිඅරච්චි**
09 ශ්‍රේණිය
**සා. ආනා දහම් පාසල - පළඟතුරය**

## ජීවිතය

ජීවිතය නැමැති මේ දිවි කතරේ
නොයෙකුත් බාධක අතරේ
සැරිසරා යමු අපි මිතුරේ
ජය ගෙන බාධක නිතරේ



**නිකේෂා ප්‍රනාන්දු**
11 ශ්‍රේණිය
**සා. ආනා දහම් පාසල**
**පළඟතුරය**

## වැස්ස

මග හයියෙන් ගොරවන්නේ
ටික ටික වතුර වැටෙන්නේ
මහ ගංගා පිරවෙන්නේ
වැස්සයි මේ ළග එන්නේ



**විශ්ව ලංකා**
10 ශ්‍රේණිය
**සා. ආනා දහම් පාසල**
**පළඟතුරය**

## කොරල්පර

මුහුදු පතුලේ විසිතුරු
ඇත පතුලේ සමුදුරු
නෙත් බැඳගන්නා සුළු
කොරල්පරයි විසිතුරු



**ජනනි හේෂිකා**
08 ශ්‍රේණිය
**සා. ආනා දහම් පාසල**
**පළඟතුරය**



## කොළඹ පදවිය

බුරුල්ලපිටිය මීසමට අයත් උඩුගම්පොල ශු. ෆ්‍රැන්සිස් අසීසි දහම් පාසලේ ළමුන් 10 දෙනෙකු පළමු වරට දිව බොදුන් ලැබීය. ආරාධිත ගරු සරත් පෙරේරා, මීසම් සේවක ගරු ඩඩ්ලි සපරමාදු (නි.ම.නි) පියතුමන්ලා, ගරු හසන්ති පැවිදි සොයුරිය, දහම් ගුරු භවතුන් සමග දිව බොදුන් ලැබූ දරුවන් සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. **සදුන් ප්‍රනාන්දු**




## කුරුණෑගල පදවිය

උඩුබද්දාව ශු. ජුවානා දර්ක් මුනිතුමියගේ දෙව් මැදුරේ ළමුන් 18 දෙනෙකු ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීය. මීසම් සේවක ගරු උපුල් සිල්වා පියතුමා, දහම් ගුරුතුමිය දරු දැරියන් සමඟ ළමා ප්‍රදීපය කැමරාවට මුහුණ දුන් අයුරු.

**මයිකල් කැනිසියස්**





## මහනුවර පදවිය

කටුගස්තොට ශ්‍රී හෘදයේ දේවස්ථානයේ දහම් පාසලේ ළමුන් 25 ක් පසුගියදා ප්‍රථම වරට දිව බොදුන් ලැබීය. මීසම් සේවක ගරු මයිකල් සන්දනම්, ගරු ටයිටස් රොඩ්රිගෝ (සා.බෙ.නි) පියතුමන්ලා, ගරු පැවිදි සොයුරියන් ළමුන් පුහුණු කළ ගුරු මැණිවරුන් සමග දිව බොදුන් ලැබූ දරු දැරියන් සමූහ සේයා රුවකට පෙනී සිටි අයුරු.

**ශාන්ති ජම්බුගේ**

# 2014 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## සිව්වන තේමාව :- ක්‍රිස්තියානි යාච්ඤාව

### අනුමාන හා ආදර්ශ ප්‍රශ්න

45. යාච්ඤාවේ දී කුමන ආකාර ඒකග්‍රතාවකින් යුක්ත විය යුතුද? ප්‍රධාන කරුණු තුනක් ගෙන හැර දක්වන්න.

46. පුරාණ ගිවිසුමේ යාච්ඤාව පිළිබඳ විශිෂ්ටතම කෘතිය කුමක්ද?

47. ගීතාවලිය ග්‍රන්ථයේ අඩංගු ගීත බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් පහක් නම් කරන්න.

48. දෙවියන් වහන්සේට කරන ලද සාමූහික යැදුම වඩා බලවත් බව තහවුරු කරන පුරාණ ගිවිසුමේ නිදසුනක් ගෙනහැර දක්වන්න.

49. ජුදිත් 4/9-15 පාඨයට අනුව සාමූහිකව යාච්ඤා කිරීමේදී තිබිය යුතු ගුණාංග පහක් ලියා දක්වන්න.

50. ජේසුස් වහන්සේ තමන් වහන්සේගේ ආදර්ශමත් ජීවිතය මගින් යාච්ඤාවේ අගය පෙන්වා දුන් සේක. ජේසුස් වහන්සේ පෙන්වා දුන් යාච්ඤාවේ ආදර්ශ පහක් ලියා දක්වන්න.

51. ස්වර්ගයෙහි වැඩ සිටින..... යැදුම අඩංගු සුවිශේෂ දෙක නම් කරන්න.

52. උත්තම පූජක යාච්ඤාවේ අඩංගු සුවිශේෂය නම් කරන්න

53. උත්තම පූජක යාච්ඤාවේ ප්‍රධාන කොටස් තුන නම් කරන්න

54. උත්තම පූජක යාච්ඤාවේ හඳුන්වන වෙනත් නමක් ලියන්න.

55. ජේසුස් වහන්සේ තමන් දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් බව පැවසූ එකම අවස්ථාව කුමක්ද?

56. නව ගිවිසුමේ ආදර්ශමත් ප්‍රශංසාවේ යැදුමක් නම් කරන්න

57. මරියතුමියගේ උදාන ගීයෙන් මතුවන ප්‍රධාන අදහස් පහක් ලියා දක්වන්න.

58. ලුක් සුවශේෂය ඇසුරු කරගෙන මාංශගත වීමේ අභිරහස සිහිකිරීමට නිර්මාණය කළ යාච්ඤාව කුමක්ද?

59. භාවනාවේ පියවර හතර ලියන්න.

60. අසීසියේ ප්‍රැන්සිස්තුමාගේ ''සාමයේ යැදුම'' තුළින් මතුකර ගත හැකි පණිවිඩ පහක් පිළිවෙලින් ලියන්න.

61. ''පියාණෙනි, ඔබ මට සවන් දුනි මම ඔබට ස්තූති කරමි,'' යන්න කවුරුන්ගේ කියමනක්ද?

62. ජපමාලය උච්ජාරණයේ දී වික්ෂෝප අභිරහස් මෙනෙහි කරන්නේ කවදා දිනවල ද?

63. ආලෝකයේ අභිරහස උච්ජාරණය කරන්නේ කවර දිනවල ද?

64. ජනවන්දනා වසර අරම්භ වන්නේ කවදා ද?

**සිව්වන තේමාව යටතේ පළවූ ප්‍රශ්න සඳහා පිළිතුරු ලබන සතියේ**

**ගරු ඩේමියන් පෙරේරා පියතුමා**

## මීගමුව දිසා ධර්මදූත ළමුන්ගේ මරිය රැළිය

මීගමුව දිසා ධර්මදූත දරුදැරියන් සහ සජීවක සජීවිකාවන් එකතුව ''මරිය වසර'' මූලික කරගෙන මරිය රැළියක් පවත්වන ලදී. මීගමුව, මහවීදිය සා. මරියා දෙව් මැදුරෙන් පටන් ගෙන කුට්ටිදුව පාතිමා මාතා දේවස්ථානය කරා පා ගමනින් ළමෝ ගමන් කළහ. මෙහිදී විශේෂ වැඩසටහනක් ගරු ටෙරන්ස් ප්‍රසංග පියතුමන් විසින් මෙහෙයවිය.

මීගමුව, දිසා ධර්මදූත අධ්‍යක්ෂ ගරු නලින් සුරාජ් පියතුමා සහ ධර්මදූත සජීවකයන් එක්ව සංවිධානය කළ මෙම රැළිය සඳහා මීගමුව දිසාවේ මීසම් වලින් ළමුන් 400 ක් පමණ සහභාගී වූණි මහවීදිය මීසම් සහයක ගරු චානක ජැන්ස් පියතුමාද මීට එක්වුණි.

**ප්‍රියංගිකා රොෂාරි**



# ගම්පහ සිරිකුරුස විදුහල් විවාද කණ්ඩායම අනුශූරතාවය දිනයි

ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලය විසින් සංවිධානය කරන ලද 2014 ලුතිනන් සම්පත් ශ්‍රී සමරනායක අභියෝග ශූරතා විවාද තරඟාවලියෙන් ගම්පහ සිරිකුරුස විදුහලට අනුශූරතාව හිමි විය. පාසල් කිහිපයක් අභිබවා අවසාන මහා තරගයෙන් සපුගස්කන්ද විශාඛා බාලිකා විද්‍යාලය හා තරඟ වැදී අනුශූරතාවය ලබාගත් ගම්පහ සිරිකුරුස විදුහල මෙම තරගාවලියට සහභා ගීවු එකම කතෝලික පාසල වීමද විශේෂත්වයකි. ජයග්‍රාහි විවාද කණ්ඩායමේ සාමාජිකයින් ධනුෂා ලියනගේ, අංජලිකා පෝල්, කෞමදි කැරැවිගොඩ, උප ප්‍රධාන ශිෂ්‍ය නායිකා නිම්නාදි රොද්‍රිගෝ, සිසුවියන්, කථික හා විවාද සංචිතය භාර පුෂ්පා ගුරුමෑණියන්, උප විදුහල්පති ගරු මේරි දර්ශිකා, විදුහල්පති ගරු මේරි දීපානි පැවිදි සොයුරියන් සමඟ සමූහ සේයරුවකට පෙනී සිටි අයුරු. **කුමර**



# ළමා ඔබත් යහපත් පුරවැසියෙක් ද?

ෆ්‍රීඩා විල්ලවරායන් විසිනි

අපේ දක්ෂතා වැඩි දියුණු කර ගත යුතුයි....

උපතින්ම අප එකිනෙකාට විශේෂ දක්‍ෂතා උරුමවී ඇති බව මේ චූටි දූ පුතාලා සැවොම දන්නා කරුණක්. සෑම විටම අපටම ආවේනික වූ එම විශේෂ දක්‍ෂතාවයන් ඔප්නංවා ඒ මඟින් සමාජයටත් රටටත් වැඩ දායක වන පරිදි ක්‍රියා කිරීමට අප වග බලා ගත යුතුයි. මේ සඳහා අපට අපගේ දෙමව්පියන්ගේ සහ ගුරුවරුන්ගේ නොමසුරු සහාය සහ ධෛර්යමත් කිරීම් අවශ්‍ය වෙනවා. ඒ තුලින් ක්‍රීඩා, සංගීතය සහ කලා කටයුතු වැනි අතිරේක අධ්‍යාපනික අංශ කෙරෙහි අවධානය යොමු කිරීමෙන් අපට අපේ චරිත වර්ධනය දියුණු කර ගත හැකි වනවා පමණක් නොවෙයි අනාගතයේදී යහපත් සමාජයක් බිහි කරන්න දායකවීමට ද හැකි වෙනවා.

අවංකව කටයුතු කරන්න පුරුදු විය යුතුයි....

අවංක පුද්ගලයාට දෙවියන් පවා ගරු කරනා බව අපේ වැඩිහිටියන් අපට නිතරම පවසනවා. අවංක සිතකින් කටයුතු කරන කෙනෙකුට හැර වෙන කිසිම කෙනෙකුට සිතේ සහනයෙන් ජීවත් වන්න අමාරුයි. ඊට හේතුව අපගේ "හෘදසාක්ෂිය" නැත්නම්"ඇතුල් සිත" අපට කොඳුරා අප කළ වැරදි ක්‍රියාවන් ගැන නිතරම මතක් කරන නිසායි. කුඩා කළ සිටම අපත් හොර බොරු වංචා කිරීමට යොමු නොවී සෑම අවස්ථාවකදීම අවංක සිතින් ක්‍රියා කරන්නට අප තරයේම සිතා ගත යුතුයි.

නොබියව ඉදිරියට යායුතුයි.....

ධර්මිෂ්ට සමාජයක් ගොඩ නැඟීම අප සියලුම දෙනා සතු වගකීමක්. මෙම කාර්යයේදී අපට නො බියව කටයුතු කිරීමට සිදුවන අවස්ථා එමටයි. අප ගුරු දෙගුරුන්ගේ අවවාද අනුශාසනා පිළිපදිමින් නිසි අවස්ථා වලදී නිසා අයුරින් වගකීම් සහිතව සහ ධෛර්යමත්ව කටයුතු කිරීමට අප පුරුදු පුහුණු විය යුතුයි. එවිට අනපේක්ෂිකව පැන නඟිනා ගැටලු වලින් මිදී සෑම බාධකයන් සහ කරදරයක්ම පරාජය කරමින් ඉදිරියටම යාමට අපට හැකි වනු නොඅනුමානයි.

ලොවට වැඩදායක වන ලෙස කටයුතු කළ යුතුයි....

සමාජයක් තුළ ජීවත් වන විට විශාල වැඩ කටයුතු සම්භාරයකට මැදිහත් වීමට කුඩා කළ සිටම අපට සිදුවන බව අප හැමෝම හොඳින් දන්නා කරුණක්. අප කුඩා අවදියේ සිට අපේ දෙමාපියන් සහ ගුරුවරුන්ගෙන් ලබාගත් ගුරුහරුකම් මතකයට නංවමින් සහ ඒවා ක්‍රියාවට යොදවමින් අප සැම විටම සාමුහිකව වැඩ කටයුතු කිරීමට පුරුදු විය යුතුයි. නිවැරදි මඟ යමින් කල්පනාකාරීව යහපත් සිතින් වැඩ කටයුතු කිරීමට පුරුදු වූ විට සමාජයටත් රටටත් ඵලදායක වන අයුරින් අපගේ ජීවන රටාව හැඩගස්වා ගැනීම අපහසු කරුණක් නොවේ.

# අති උත්තම ප්‍රැන්සිස් ශුද්ධෝ
# ශ්‍රී ලංකා ගමන නිමිත්තෙන්



**කුරුසිය**

මෙහි පෙන්වා ඇති කුරුසිය ශ්‍රී ලාංකික කුරුසියකි. ඓතිහාසික අනුරාධපුර නගරයේ පුරා වස්තු ගවේශනවලදී සොයා ගත් සා. තෝමස් මුනිතුමාගේ කුරුසිය ආදර්ශයට ගනිමින් කෙරුණකි. මෙම කුරුසියෙහි පහළ, මැරුණු ලීය නැවත පණ ගැන්වී නව ජීවයක් ලබන ආකාරය පිළිබිඹු කෙරන අතු පතර දෙකකිග එය ක්‍රිස්තු තුමන්ගේ මරණයෙන් උත්ථාන වීම දැක්වීමේ ලාංඡනයකි. එබැවින් එය මරණය පමණක් නොව උත්ථානය ද සංකේතවත් කරන අභිමානනීය කුරුසියක් (Glorious Cross) ද වේ. දෙවැනි ලෝක යුද්ධයට පසු ශ්‍රී ලංකා කතෝලික සභාව ශුද්ධවූ මරිය තුමියට කැප කිරීම සංකේත ගත කිරීමට කුරුසිය නිල් පාටින් වර්ණ ගැන්වේ. එම කැප කිරීමේ පටන් 'ලංකාවේ අප ස්වාමිදුව' නමින් හැඳින් වෙන මරිය මව්තුමියට, අප තුළ ඇති ආදරය හා භක්තිය ද ඉන් දැක්වෙයි.

**මකුටය :** (Mitre)

ශුද්ධෝත්තම ප්‍රැන්සිස් පාප් වහන්සේගේ නිල ලාංඡනය හි දැක්වෙන පරිදි මෙම ලාංඡනයෙ හි ද මකුටය කහ හා සුදු වර්ණයන්ගෙන් දැක්වේ. එය පිටු පසින් එල්ලා වැටෙන කොටස් රතු හා කහ වර්ණයන්ගෙන් ද දැක්වෙන අතර එම කොටස් මෙම අවස්ථාවේ දී වඩාත් වැදගත් වදන් වන 'ශුද්ධෝත්තම ප්‍රැන්සිස් පාප්වහන්සේ' හා 'ශ්‍රී ලංකා ගමන - 2015' යන වදන් වටකර ගන්නා ආකාරයක් දක්වයි. ශුද්ධෝත්තම පියතුමන්ගේ මකුටය අපගේ ආධ්‍යාත්මික ශක්තිය, මඟ පෙන්වීම හා ශුද්ධවු සභාවේ නායකත්වය සංකේතවත් කරයි. ශ්‍රී ලංකාවේ කතෝලික සභාව නියෝජනය කරන ශ්‍රී ලාංකික කුරුසියට පසුතලය ලෙස විශ්වීය ශුද්ධවු සභාව (Universal Church) නියෝජනය කරන මකුටය දැක්වේ.

**භාග්‍යවන්ත ජුසේ වාස් මුනිතුමා**

1995 දී පැවැත් වූ ජුසේ වාස් පියතුමා භාග්‍යවරයට එසැවීමේ උත්සවයේදී සා. දෙවැනි ජුවාම් පාවුළු මුනිතුමා භාග්‍යවත් ජුසේවාස් පියතුමා 'ශ්‍රී ලංකාවේ අපෝස්තුලු වරයා' ලෙස හඳුන්වන ලදී. එතුමෝ ශ්‍රී ලංකා කුරුසිය ඔසවා ගෙන එය වෙත තම අත දිගු කරනු ලාංඡනයෙ හි දැක්වෙයි. ශ්‍රී ලංකා කතෝලික සභාව ලන්දේසි පීඩන සමයෙන් එතෙර කිරීමේ පුරෝගාමී යාණන් ලෙස එතුමන් සැලකිය හැකි ය. උන්වහන්සේ එකළ ලංකාවට නොපැමිණියේ නම් පෘතුගීසි මිෂනාරිවරු වැපුරූ බීජ ලන්දේසි මර්ධනය හමුවේ විනාශ වී යනු ඇත. එතුමන්ගේ ලංකා ගමනයේ සිට වසර 150 ක් පමණ වූ ලන්දේසි ආගම් පීඩන සමය පුරා ජුසේ වාස් පියතුමාගේ නිකාය විසින් පූජක තුමන්ලා ලංකාවට සපයනු ලැබී ය. ඔවුහු ජුසේ වාස් පියතුමා තුළ වූ ධර්ම දානයේ උද්‍යෝගය රැකගත් අතර, විශ්වාසය තවදුරටත් පුළුල් කළ හ.

වතිකානයේ 'සිස්ටයින්' දෙව්මැදුරේ ඇති මයිකල් ආන්ජලෝ චිත්‍ර ශිල්පියා සිතුවම් කළ 'ආදම්ගේ මැවිල්ල' බිතු සිතුව මෙහි දැක්වෙන දෙවියන් වහන්සේගේ දකුණ'ත

# ධෝත්තම පියතුමන්ගේ 2015
# නිකුත් කැරෙන ලාංඡනය




සේ නිමැවුණු අතකින් ජුසේ වාස් පියතුමා කුරුසිය දක්වයි. දෙවියන් වහන්සේ මිනිසාට දකුණ'තින් ජීවිතය දනය කරන ආකාරය 'ආදම්ගේ මැවිල්ල' බිතු සිතුව මෙහි නිරූපණය වන අතර, එම අත ම මෙහි යොදා ගැනීමෙන් එකළ පීඩනයට පත් කරනු ලැබූ ලංකා කතෝලික සභාව ජුසේ වාස් පියතුමා නැවත පණ ගැන්වීම සංකේතවත් කෙරේ.

චිත්‍ර ශිල්පී කරවජ්ජෝ 'මතෙව් තුමාගේ කැඳවීම' නම් වූ ඔහුගේ චිත්‍රයෙහි ජේසුතුමන් තමන් අනුගමනය කිරීමට මතෙව් තුමා කැඳවන දකුණ'ත සඳහා ද මෙම සංකේතාත්මක භාෂාව උපයෝගී කර ගනියි. එම සංකේතාත්මක භාෂාව මෙම ලාංඡනයට යොදා ගැනීමෙන් භාග්‍යවත් ජුසේ වාස් මුනිතුමා, අපගේ ධර්මදූතිය වගකීම ඉටු කරමින් ජේසු සමිඳුන් අනුගමනය කරන්නැයි අපට කරන ආයාචනය පිළිබිඹු කරයි.

කිතුනු උරුමය

**වර්ණ හැඩ තල**

පාප් වහන්සේගේ මකුට දෙපස ශ්‍රී ලංකා ධජයේ වර්ණ හතර වන රතු, තැඹිලි, කහ සහ කොළ වර්ණ දැක්වේ. එමගින් ශ්‍රී ලාංකික ජාතියේ බහු වාර්ගික, බහු ආගමික ස්වභාවය නියෝජනය කෙරෙයි. මකුටය දෙපස ඇති මෙම වර්ණ හතර, වැළඳ ගැනීමට සැදුනු දෑතක හැඩයෙන් නිමැවී ඇත. මේ මගින් අපි ශ්‍රී ලාංකික සභාව ශුද්ධෝත්තම පියතුමන් උණුසුම්ව පිළිගනු ලැබීම සංකේතවත් කරයි.

**හැඩය**

සමස්ත නිර්මාණයේ සංයුතිය නෙලුම් පොහොට්ටුවක හැඩය දක්වයි. එය ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය වන නිල් මහනෙල් පුෂ්පයේ සේයාවක් වේ. එහි මැද කොටස කඳුළු බිඳුවක හා දිගටි මුතු ඇටයක හැඩයක් ගනියි. අප දිවයින විදේශිකයින් හැඳින් වූ 'ආසියාවේ කඳුළු බිඳුව',' ආසියාවේ මුතු ඇටය' යන නාමයන් ඉන් සිහි ගැන්වේ.

**සංක්ෂිප්තය**

සමස්තයක් වශයෙන් ගත් කළ මෙම ලාංඡනයෙන් පෙන්වන්නේ ශ්‍රී ලංකා කතෝලික සභාව ශුද්ධෝත්තම පියතුමාගේ කරුණාබර නායකත්වයත්, එතුමාගේ එඩේරිකත්වයත් ඉත සිතින් පිළිගන්නා අතර එතුමන් උණුසුම් බැතියෙන් පුදනු ලබන බවයි.

**විස්තරය - ගරු ප්‍රියන්ත සිල්වා පියතුමා (ලාංඡනයේ නිර්මාණකරු)**

✍ ශිරාන් මෛත්‍රී

# Unknown Catholic Saints

## St. Catherine of Alexandria

### *Feast Day - (November 25)*



*A detail from the Mystic Marriage of St Catherine of Alexandria and St Catherine of Siena by the Italian Renaissance painter of the Milanese school Ambrogio Bergognone*

St. Catherine of Alexandria, also known as St Catherine of the Wheel, was the daughter of Alexandria's King Costus and Queen Sab. inella, according to her hagiography. Born *c* 282, she converted at 14 after seeing a vision of the Blessed Virgin Mary giving her to Christ in mystical marriage.

An exceptional student in the arts and sciences, she announced that she would only marry someone "who surpassed her in beauty, intelligence, wealth, and dignity", which was taken as a reference to Christ. In any case, no decent enough ' men were available on earth and she remained a virgin.

She is said to have brought hundreds to the faith, and even tried to convince the Emperor Maxentius to stop persecuting Christians and worshiping false idols. The emperor arranged for the best pagan philosophers to debate her. She even convinced some of them to embrace Christianity. As a result, they were put to death.

Catherine apparently converted Maxentius's wife, who of course was then killed. She had been among 200 people who came to visit Catherine when she was imprisoned. Refusing to recant after various tortures, she was condemned to be broken on the wheel and then beheaded.

Catherine is venerated by both the Orthodox and Catholics. She is one of the Fourteen Holy Helpers who Catholics turn to for intercession. But she is, historically, an unlikely figure, and her feast day was removed from the General Roman Calendar in 1969, only for it to be restored in 2002 as an optional memorial. Unlike most saints of the period, Catherine cannot be identified with any historical figure and her earliest biographies come 500 years later. One possibility is that she is based on a woman written about by the chronicler Eusebius in 320: a young Christian put to death because she had refused to become his mistress.

Her tradition was certainly established by the sixth century, when Emperor Justinian established St Catherine's Monastery in Mount Sinai. Today the monastery is a rich source of Christian art and architecture, including the most precious Coptic icons.

St Catherine's cult become a major part of Christianity in the medieval period, and among the many western European shrines to Catherine were those at Canterbury and Westminster. The patron saint of learning, she was the inspiration for St Catharine's College, Cambridge, founded on her feast day in 1473 to further the study of theology and philosophy.

# දියමන්ති වසරට ළඟා වන නුවර දෙව්සත්හල

**නුවර අම්පිටියේ ජාතික දෙව්සත්හල මේ මස පළමු දින 2014 - 2015 අධ්‍යයන වර්ෂය ආරම්භ කළේ ය. මේ සමඟ එම පූජනීය ආයතනය පා තැබුවේ එහි 60 වැනි හෙවත් දියමන්ති ජයන්ති වසරට යි.**



නුවර ජාතික දෙව්සත්හලේ ඉතිහාසය යුග දෙකකට අයත් වන්නේ ය. පළමු යුගය "පේපල් සෙමිනරි" හෙවත් පාප් වහන්සේ නමින් වූ දෙව්සත්හලයි. දෙවැනි යුගය "ලංකා අප ස්වාමිදූ ගේ ජාතික දෙව්සත්හල" යි.

"පේපල් සෙමිනේරිය" නමින් වූ දෙව්සත්හල ආරම්භ කරන ලද්දේ ක්‍රි.ව. 1893 දී ය. 13 වැනි ලියෝ ශුද්ධෝත්තම පාප් වහන්සේ දුර දැක්මෙන් හා දහම් උද්යෝගයෙන් සැලැසුම් යොදා සිටියේ දකුණු ආසියාව තුළ ධර්ම ප්‍රචාරය සඳහා දකුණු ආසියාතික ජාතින්ටම අයත් පිරිස පූජකවරය සඳහා පුහුණු කැර පත්කරලීම යි.

ඒ අනුව එවකට ඉන්දියාවේ තානාපතිව සිටි (අපෝස්තලික තානාපති) මාහිමි ඇන්ටෝනියෝ අලිගාර්ඩි තුමන්ට මේ ප්‍රදේශයේ දෙව්සත්හලක් ඉදිකිරීම සඳහා සුදුසු බිමක් තෝරා නම් කරන ලෙස උපදෙස් දී තිබිණි. එහෙත් කල් ගතවීමත් සමඟ එතුමා ඉන්දියාවෙන් බැහැරව ගියේ ය. මේ කාලය තුළ එතුමා වඩාත් මනාපය දැක්වූයේ ඉන්දියාවේ ම බැංගලෝර් නුවරට හෝ පූනේ නුවරට යි. අලිගාර්ඩි හිමිපාණන් ඉන්දියාවෙන් සමුගැනීමත් සමඟ එම තනතුරට පත් වූයේ කලක් එතුමන් ගේ ලේකම්ව සිටි මාහිමි ලැඩිස් ලෝස් මයිකල් සැලෙස්කි හිමිපාණන් ය. දකුණු ආසියාව හොඳින් දැන සිටි එතුමන් ගේ ඒකාන්ත තීරණය වූයේ මේ දෙව්සත්හල ලංකාවේ නුවර ඉදිවිය යුතු බව යි. රෝමයේ 13 වැනි ලියෝ පාප් වහන්සේ ද එම යෝජනාව පිළිගෙන අනුමත කළහ. මේ අනුව ඉතා අලංකාර ලෙස එහි ගොඩනැගිලි ඉදිකෙරිණි.

මෙම දෙව්සත්හල විශ්ව විද්‍යාලයක් ලෙසද පිළිගැනුණි. මෙය රෝම සරසවියට අනුබද්ධ කොට දේව ධර්මය සහ දර්ශන ශාස්ත්‍රය යන ක්ෂේත්‍රයන් තුළ උපාධි පිරීමේ අවසරය ලබා ගත්තේ ය. එවකට මෙහි පරිපාලනය බාර වූයේ ජේසු නිකායේ පියවරුන් වෙත යි. මෙය දිවයිනේ ප්‍රථම සරසවිය ලෙස සැලැකේ. මෙහි පූජක පුහුණුව ලද්දෝ ඉන්දියානුවෝ, පාකිස්ථාන හා බංගලිදේශිකයෝ වූහ. එ කල මේ සියල්ල එක ම උප මහාද්වීපයක් ලෙස ඉන්දියාව විය.

මේ අතර 60 දෙනකු රදගුරු හා අගරදගුරු තනතුරුවලට ද ඔසවන ලදි. ඉන්දියාවේ ප්‍රථම කාදිනල් හිමිපාණන් වන අති උතුම් වැලේරියන් ග්‍රේෂස් හිමිපාණන් කරාචියේ ජෝසෆ් කෝර්ඩියේරෝ සහ අර්නාකුලම්හි ජෝසෆ් පරකට්ටිල් කාදිනල් හිමිවරු ද මෙහි ආදි සිසුවෝ වෙති. ලංකාවෙන් මෙම දෙව්සත්හලට සිසුන් යවන ලද්දේ ගාල්ල, නුවර, ත්‍රිකුණාමලය සහ හලාවත රදගුරු වසම් තුළින් පමණි. සෙසු පූජක සිසුවෝ කොළඹ සා. බර්නාඩ් දෙව්සත්හලේ පුහුණුව ලදහ. නුවර පූජක සිසුන් සුදු ලෝගුවට රතු බඳ පටිය බැඳ සිටි හෙයින් පහසුවෙන් හඳුනාගත හැකි විය. නිමල මරිය නිකායේ පූජක සිසුන් පුහුණුව ලැබුවේ තමන් සඳහා ම කොහුවල ග්‍රීන් පාත් හි පිහිටි පුහුණු මධ්‍යස්ථානයේ ම ය.

ලංකාව, ඉන්දියාව, පාකිස්තානය ආදි දකුණු ආසියානු රටවල් දේශපාලන නිදහස ලැබීමත් සමඟ තත්ත්වය හාත්පසින් වෙනස් විය. මේ අතර ප්‍රධාන ප්‍රශ්නයක් වූයේ ලංකාවට ඉන්දියානුවන් ගේ පැමිණීම සීමා කිරීම යි. දකුණු ඉන්දියාවෙන් ලංකාවට රහසේ සංක්‍රමණය වන "කල්ලතෝනි" නමින් හඳුන්වනු ලැබූ පිරිස එ කල රටට විශාල ප්‍රශ්නයක් වී තිබිණි.

මේ නිසා වීසා බලපත්‍ර ලබා ගැනීම වැනි ප්‍රශ්න රැසකට මේ සිසු පිරිසට ද මුහුණ පාන්නට සිදුවිය. මේවා සලකා බලා දෙව්සත්හල ඉන්දියාවේ පූනා නගරයට ගෙන යන්නට තීරණය කරන ලදි. ඒ අනුව ක්‍රි.ව. 1955 මැයි මස අධ්‍යාපන වසර නිමවීමත් සමඟ පේපල් සෙමිනේරිය හෙවත් දෙව්සත්හල දිවයිනෙන් ඉවත් විය.

එහි සිටි ලාංකික සහෝදරතුමන්ලා ස්වල්ප දෙනෙක් පමණක් නව ලංකා අප ස්වාමිදූගේ ජාතික දෙව්සත්හලට ඇතුළුවනු සඳහා මෙහි රැඳී සිටියහ. එම ගරු සහෝදරතුමන් වූයේ ලූක් ජයසූරිය (ගාල්ල) ෆිලිප්නේරි ප්‍රනාන්දු, ලෙනාඩ් ද කොස්තා සහ පැන්ටලියන් ජයවර්ධන (හලාවත), ඩෙන්සිල් පෙරේරා (මහනුවර), ජෝසෆ් කොස්තා (ත්‍රිකුණාමලය) ය.

**ඉතිරියට.........**

**විශ්‍රාමික අගරදගුරු අති උතුම්**
**ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් විසිනි**



## ජපමාල දේව මාතාවෝ

**ඩිල්ෂාන් සම්පත් ප්‍රනාන්දු**

13 ශ්‍රේණිය
සා. ප්‍රැන්සිස්කන් කැපුචින් කනිටු
දෙව්සත්හල - කොච්චිකඩේ

## දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ

**දිමුතු සෙනාල්**

04 ශ්‍රේණිය
පාතිමා මාතා දහම් පාසල - යායමුල්ල
( වල්පිටගම මීසම)





## උත්ථානවූ ජේසු සමිඳාණෝ

**තරුෂිකා සෙව්වන්දි**

06 ශ්‍රේණිය
ශු. මිඛායෙල් අග්‍රදූත දහම් පාසල
නාගොඩ , කළුතර




## පරිසරයේ අසිරිය

**ශානුකී ශෂිප්‍රභා**

10 ශ්‍රේණිය

සිරිකුරුස විදුහල
ගම්පහ





## සුරතල් මසුන් රංචුවක්

**නිකේෂලා කාව්‍යාංජලි**

03 ශ්‍රේණිය
කාර්මෙල් දේව මාතා දහම් පාසල - වැල්ල පල්ලිය



## දෙවිඳුන් අපට දුන් ලෝකය

**ෂනාලි දිල්ෂාරා**


03 ශ්‍රේණිය

ශා. ඇලෝසියස්

දහම් පාසල

රඹුක්කන

# ශු. මරියා ද රෝසා මුනිවරිය






ක්‍රි ව 1813 නොවැම්බර් මස 06 වන දින ඉතාලියේ බෙරීසිකා ග්‍රාමයේ උපන් මරියා ද රෝසා තුමිය වංශවත් පවුලකට දාව උපත ලැබීය. ස්වකීය අධ්‍යාපන කටයුතු සදහා විසිටේෂන් කන්‍යා සොයුරියන් යටතේ විධිමත් අධ්‍යාපනයක් ලබන්නට ඕ හට හැකියාව ලැබිණි. එහෙත් ඇගේ වයස අවු 17 දී සිය මවගේ ස්වර්ගස්ථ වීමත් සමගම පවුලේ වැඩිමලා ලෙස සිය පියා සමග එක්ව සිය පවුලේ ප්‍රධානම ආදායම් මාර්ගය වූ වතු වගාවන්ගේ හා ධාන්‍ය මෝල් වල වැඩ කරන්නට ඇය හට සිදුවිය.

කුඩා කළ සිටම දයාවේ ක්‍රියාවන්ට ඉතාමත් ලැදියාවක් දැක්වූ මෙතුමිය 1839 දී පමණ බෙරීසිකා හි උද්ගත වූ යුද්ධ සමයේ දී සිය මූලිකත්වය හා නායකත්වය තුළ අසරණ වූ තුවාල වූ අබ්බගාත වූ රෝගීන්ට හා සෙබළුන්ට ඇප උපස්ථාන කිරීමේ අටියෙන් නිවෙස් වල හුන් තරුණියන් කැදවාගෙන මෙකී උදාරතර මෙහෙවරට කැපවුනාය. මේ වන විට මරියාගේ වයස අවු 30ක් පමණ විය. මෙම සංඝය හදුන්වන ලද්දේ දයාවේ දාසියන් ලෙසටය. මෙම නිකායේ අරමුණ වූයේ අසරණ, රෝගීවන මහළු හා එක්තැන් වන සියල්ලන් තුළ වැඩ වසන ජේසු සමිදාණන් අත්දැක එමගින් ඔවුන් හට පිහිට වීමය. උතුරු ඉතාලියේ හා ප්‍රංශයේ පැවති සිවිල් හා අභ්‍යන්තර යුද සමයේදී මේ නිකායෙන් සිදුවූ සේවාව අති ප්‍රශංසනීය වේ. මේ නිකායේ සිදු කරන මෙහෙවර අතර දෘශ්‍යාබාධිත පුද්ගලයන්ට ද ඉතා ප්‍රබල සේවාවක් ඉටු කරයි.

විශේෂයෙන් ඉහත කී යුදමය තත්වයන් තුළ මිලටරි වෙත ගොස් අභීතව ක්‍රියා කිරීමට මේ පැවිදි සොයුරියෝ උත්සුක වූවෝය. මේ නිසා බොහෝ කාලයක් මේ පැවදි නිකායික සොහොයුරියෝ රෝහල් වල සාත්තු සේවාවේ නිරත වූවෝය. මෙතුමියගේ ආධ්‍යාත්මික මෙහෙවර තුළ ප්‍රේමය තුළ කුරුස ගමනක නිරත දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයකි. ක්‍රි.ව 1855 දෙසැම්බර් 15 වන දින මෙතුමිය ස්වර්ගස්ථ වූ අතර XII වන පියුස් ශුද්ධෝතම පියතුමා තුළින් 1940 මැයි මස 26 වන දින භාග්‍යවරයට නම් කොට 1954 ජුනි 12 වන දින ශුද්ධවරයට ද ඔසවන ලදි.

**අසේල දසනායක විසිනි**


මාසික
සිතිවිල්ල



"ඔක්තෝබර් මාසය"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

සේයා :-
අශේන් එස්. සේනාරත්න

ජයග්‍රාහී නිර්මාණය ලබන සතියේ පළ කෙරේ


යුදෙව් බයිබලය ඇසුරෙනි...
මෝසෙස්
73
සැකසුම, දෙවස් චිත්‍ර ශාලිනී සඳු අරවින්ද
හෝර් මුදුනට ගිය මොහොතේ මෝසෙස් සහෝදර ආරොන් තුමා මිය ගියේය... ඔහු... මෝසෙස් සමග එකට හිඳ ඊශ්‍රායෙල් ජාතිකයන් වහල් බවෙන් මුදවා ගන්නා අරගලයේදී මෝසෙස් ගේ සෙවනැල්ල මෙන් සිට කටයුතු කළ අයෙකි.
පසුව..
ඔන්න... අර මෝසෙස් හා ආරොන් පුත් එළියාසර් දෙන්න පහළට බහිනවා..... ...කෝ... ආරොන්...
කෝ අපේ පූජකතුමා... ආරොන්..
අර බලාපල්ලා ආරොන් තුමාගේ ඇඳුම් ඔහු පුත් එළියාසර් ඇඳගෙන ... එන හැටි....
කෝ... ආරොන් තුමා.....
මෝසෙස් ඊශ්‍රායෙල් වරුන් අමතා..
මිනිසුනේ.. අද පටන් නුඹලාගේ ප්‍රධාන පූජක තුමා වන්නේ මේ එළියාසර් යි..
මා සහෝදර ආරොන්... නුඹලාගේ ප්‍රධාන පූජකතුමා හෝර් මුදුනේදී මියගියා....
අහෝ.. අපේ.. ආරොන් තුමා
අහෝ... ආරොන් තුමා අපේ අරගලවලදී... මෝසෙස් හා අප... ළඟින්ම සිටියා...
එයින් පසු දින තිහක් ම ඊශ්‍රායෙල් ජාතිකයින් ආරොන් තුමා වෙනුවෙන් දුක්වූහ..
ඉන්පසු...
සහෝදර වරුනි.. මේ ඒදෙම් දේශයේ රජතුමා අපට රට මැද්දෙන්... යන්න දෙන්නේ නෑ....
එනිසා ඒදෙම් දේශයේ.. මායිම වටෙන් අපි ගමන් කරමු..

# ප්‍රහේළිකා අංක 48

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | 2 | | 3 | ■ |
| | ■ | | ■ | | ■ |
| | ■ | | ■ | 4 | 5 |
| | ■ | | ■ | ■ | |
| | ■ | 6 | 7 | | |
| 8 | | ■ | | ■ | |

## හරහට

1. ක්‍රිස්තුන් වහන්සේ තම ඉගැන්වීම් වලට මෙම ගස බොහෝ විට යොදා ගත් සේක.

4. යක්ෂයා ක්‍රිස්තුන් වහන්සේව උස් තැනකට පමුණුවා , ලෝකයේ සියළු රට රාජ්‍යයන් හා ඒවායේ ..... ඉසුරු ද පෙන්වා, යක්ෂයාට වඳින්නේ නම් ඒවා ලබා දෙන බව කීවේය. මෙහි හිස්තැනට සුදුසු වචනය

6. ....................විශ්වාස කිරීම සෙවනැන්ලක් අල්ලා ගැනීම වැනියැයි උපදේශකයා හෙවත් සිරාක් පවසයි. . මෙහි හිස්තැනට සුදුසු වචනය.

8. මිනිසෙකුගේ ගමන් මග සමිඳාණෝ මෙහෙයවන සේක. එසේනම් යමෙකුට තමා................... මග තේරුම් ගත හැකිදැයි හිතෝපදේශයේ විමසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය

## පහළට

1. ''ක්‍රිස්තියානි'' යන නාමය ගෝලයින්ට පළමු කොට දෙනු ලැබුවේ මෙහිදීය.

2. ක්‍රිස්තුන් වහන්සේ පන්දහසකට කෑම ලබා දීමේ සිද්ධියට පෙර මෙම මුහුදෙන් එගොඩට වැඩම කළ බව ශුද්ධවූ ජුවාම් තුමා පවසයි.

3. පව්කාරයා මනස්ථාපනය වී පැමිණෙන තුරු දෙව්පියාණන් වහන්සේ අත් නොහැර බලා සිටින බවත්, එසේ පැමිණි විට සන්තෝෂවන බවත් පෙන්වූ එක් උපමාවකි, නැති වූ ......... පිළිබඳ උපමාව. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. වෙහෙසවන , බර උසුලන සියල්ලෙනි, මා වෙතට එන්න. මම ඔබට ...... දෙමි. ක්‍රිස්තුන් වහන්සේ වදාල සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

7. ජෝසප්ගේ සහෝදරයන් ඔහු සමග ඊර්ෂ්‍යායෙන් ජෝසප්ව මෙවැන්නක හෙලුවේය.

මෙම ප්‍රහේළිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපකාර කරගත හැකිය. ශු. ලූක් 4/6, 15/8, ශු මාක් 11/20, ශු. මතෙව් 11/28 , ශු. ජුවාම් 6/1, ක්‍රියා 11/26, උපදේශකය හෙවත් සිරාක් 34/2, හිතෝපදේශය 20/24, උත්පත්ති 37/24

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා - කිරිමැටියාගාර**



වැල්ලවාය ශා. මරියා දහම් පාසල් ඉතිහාසයේ ප්‍රථම වතාවට ඉදිරිපත් වෙමින් විභාග දෙපාර්තමේන්තුව මගින් පැවැත්වූ දහම් පාසල් අවසන් විභාගයෙන් ''ඒ'' සාමාර්ථ දෙකක් හා ''බී'' සාමාර්ථ දෙකක් ලබා ගනිමින් උසස් ලෙස සමත් වීමට මනුජ දිසානායක ශිෂ්‍යයා සමත්වුණි. මීසම් සේවක ගරු ඇන්තනී හේමන්ත පියතුමන් වෙතින් මනුජ තම සහතිකය ලබා ගත් අවස්ථාව මෙහි දිස්වේ.

**දහම් පාසල් හා පාසල් වල දිව බොඳුන් ලැබීම් හා සුදතුම් වරම් ලැබීම් වල ඔබ එවන සේයාරූ පැහැදිලි විය යුතු අතර සමුහ සේයාරුවක් පමණක් අපට එවන්න.**

**එසේම දිව බොඳුන්, සුදතුම් වරම් ලැබූ ළමුන් සංඛ්‍යාවද සඳහන් කර එවන්න. ළමා ප්‍රදීපයේ පළ කිරීමට ඔබ එවන සේයා රූ පළ කිරීමේදි අප විසින් මෙහි සඳහන් කරුණු පිළිබඳව වඩාත් සැලකිලිමත් වන බව කරුණාවෙන් සළකන්න.**

**සංස්කාරක පියතුමා**

# සිඟිති බයිබලයෙන්...



අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් විසින් සම්පාදනය කරන්නට යෙදුනු 'සිඟිති බයිබලය' දැන් මුද්‍රණය වී ඔබ වෙනුවෙන් නිකුත් කර ඇති අතර මෙහි ඇතුලත මර්සලින් හීන්කෙන්ද චිත්‍රශිල්පියාගේ අලංකාර සිතුවම් රාශියකින් හැඩ වී තිබෙනවා. බයිබලයේ කතාව ඉතා සරලව රසවත්ව කාව්‍ය භාෂාවෙන් මෙහි අන්තර්ගත වී තිබෙනවා.



